සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

| 51 | S | I |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 12 - 2019

විභාග අංකය ................................. **චිත්‍ර I** කාලය පැය තුනයි

| | | |
|---|---|---|
| උපදෙස් | - | මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විතය. |
| 1 කොටස | - | ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.<br>එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා එහි අංකය තිත් ඉර මත ලියන්න. |
| 11 කොටස | - | අනු කොටස් තුනකින් සමන්විතය.<br>එක් කොටසකින් ප්‍රශ්නය බැගින් තෝරා ගෙන, ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.<br>1 කොටස හා 11 කොටසට අදාල පිළිතුරුපත් එකට අමුණා භාර දෙන්න. |

## I කොටස

- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට වඩාත් යෝග්‍ය පිළිතුර පහත සඳහන් A, B, C, D, E යන ජායාරූප ඇසුරින් තෝරන්න.**


**A**


**B**


**C**


**D**


**E**

01. A අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1. රන්කොත් වෙහෙරයි.
2. හඟුරන්කෙත රජමහා විහාරයේ චෛත්‍යයයි.
3. පැරණි ථූපාරාමයයි.
4. ප්‍රතිසංස්කරණයට පෙර අභයගිරි චෛත්‍යයි.
5. කතරගම කිරි වෙහෙරයි. (.......)

02. B අක්ෂරයෙන් දැක්වෙන ගෘහ නිර්මාණ අංගය,
1. අරංකැලය ජන්තාඝරයයි.
2. කැබිති ගොල්ලෑව ආසනඝරයයි.
3. නිල්ලක්ගම බෝධිඝරයයි.
4. මහා විහාර පධාන ඝරයයි.
5. මිහින්තලය ආසනඝරයයි. (.......)

03. C අක්ෂරයෙන් දැක්වෙන ගෘහ නිර්මාණ අංගය,
1. කණ්ඨක චෛත්‍යයේ ආරක්ෂාවට තනන ලද්දකි.
2. රුවන්වැලි මහා සෑයේ ආරක්ෂාවට තනන ලද්දකි.
3. මිරිසවැටි චෛත්‍යයේ ආරක්ෂවට තනන ලද්දකි.
4. ජේතවනාරාම චෛත්‍යයේ ආරක්ෂාවට තනන ලද්දකි.
5. අභයගිරි චෛත්‍යයේ ආරක්ෂාවට තනන ලද්දකි. (.......)

04. D අක්ෂරයෙන් දැක්වෙන අංක 02 ශිව දේවාලය සඳහා
1. පාණ්ඩ්‍ය ගෘහ නිර්මාණ ලක්ෂණ බලපා ඇත.
2. අමරාවතී ගෘහ නිර්මාණ ලක්ෂණ බලපා ඇත.
3. ගුප්ත කලා ලක්ෂණ බලපා ඇත.
4. චෝල ගෘහ නිර්මාණ ලක්ෂණ බලපා ඇත.
5. ගාන්ධාර කලා ලක්ෂණ බලපා ඇත. (.......)

05. E අක්ෂරයෙන් දැක්වෙන ඡායාරූපයෙහි ඇත්තේ,
1. ශිව දෙවියන් උදෙසා කළ දෙවොලකි. 2. කතරගම දෙවියන් උදෙසා කළ දෙවොලකි.
3. රාජකීයයන් සඳහා කළ මාළිගයකි. 4. රජ කෙනෙකුට පිරිත් ශ්‍රවණය සඳහා කළ මණ්ඩපයකි.
5. බුදු පිළිමයක ආරක්ෂාවට තැනූ පිළිම ගෙයකි. (.......)

◆ **අංක 06 සිට 10 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

06. දෘශ්‍ය කලාව තුළ දැකිය නොහැකි අංගයක් වන්නේ,
1. මුද්‍රණ කලාවය. 2. මූර්ති කලාවය. 3. සිනමාවය.
4. සිම්ෆනි හා කැන්ටාටාය. 5. වේදිකා පසුතල නිර්මාණය ය. (.......)

07. දෘශ්‍ය කලා මූල ධර්මයන්ට අයත් නොවනුයේ,
1. සමබරතාවයයි. 2. පර්යාව ලෝකයයි. 3. අනුපාතයයි.
4. රිද්මයයි. 5. රේඛාවයි. (.......)

08. RGB හා CMYK යන අංග අයත් වනුයේ, දෘශ්‍ය කලා මූලිකාංග වල,
1. වර්ණ ප්‍රභේද වලටය. 2. හැඩතල වලටය. 3. මතුපිට ස්වභාවයට ය.
4. අවකාශ භාවිතයටය. 5. ආකෘතිය ගොඩ නැගීමටය. (.......)

09. ද්විමාන ප්‍රකාශනයකදී ඈත මෑත දැක්වීමට යොදාගන්නා දෘෂ්‍ය ප්‍රයෝගයක් වන්නේ,
1. රිද්මයයි. 2. සමබරතාවයි. 3. ත්‍රිමාණ ලක්ෂණ දැක්වීමයි.
4. පර්යාවලෝකයයි. 5. සමමිතික බවයි. (.......)

10. සොබාදහම, සූර්යා ලෝකය හා වර්ණ වෙනස්වීම් අතර ඇති සම්බන්ධතාව මූලික කොටගෙන බිහි වූ කලා ව්‍යාපාරය වනුයේ,
1. පෙරදිග වාදයයි. 2. උපස්තිථිවාදයයි. 3. ඝනිකවාදයයි.
4. යථාර්ථවාදයයි. 5. විචිත්‍ර අද්භූතවාදයයි. (.......)

◆ **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර F, G, H, I, J චිත්‍ර ඇසුරින් තෝරන්න.**


F


G


H


I


J

11. ක්‍රිස්තියානි ආගමික තේමාවකින් දේශීය ලක්ෂණ සහිතව අඳින ලද F අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
1. ඒ.සී.ජී.එස්. අමරසේකර ශිල්පියාගේ ය. 2. සෝලියස් මැන්දිස් ශිල්පියාගේ ය.
3. ජේ.ඩී.ඒ. පෙරේරා ශිල්පියාගේ ය. 4. ඩේවිඩ් පේන්ටර් ශිල්පියාගේ ය.
5. ජෙෆ්රි යූනුස් ශිල්පියාගේ ය. (.......)

12. G අක්ෂරයෙන් දැක්වෙන සිතුවමෙන්,
1. ආලේඛ්‍ය චිත්‍ර සඳහා ශිල්පියා සතු හැකියාව පිළිබිඹු වේ.
2. අධ්‍යාත්මික ගුණාංග දැක්වීම ඇද ඇති බව පෙනේ.
3. උපස්තිථිවාදී ලක්ෂණ ගුරුකොට ගත් බව පෙනේ.
4. ශිල්පියා ඝනිකවාදී ලක්ෂණ ගුරු කොට ගත් බව පෙනේ.
5. ඡායාරූප ඇඳීමේ ශිල්පියා සතු හැකියාව පිළිබිඹු වේ. (.......)

13. H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
1. අබනීන්ද්‍රනාත් තාගෝර් ශිල්පියා විසින් අඳින ලද්දකි.
2. රවීන්ද්‍රනාත් තාගෝර් ශිල්පියා විසින් අඳින ලද්දකි.
3. නාරායන ස්වාමි ශිල්පියා විසින් අඳින ලද්දකි.
4. ජෙමිනි රෝයි ශිල්පියා විසින් අඳින ලද්දකි.
5. රාජා රවි වර්මා ශිල්පියා විසින් අඳින ලද්දකි. (.......)

14. I අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
1. යුරෝපීය පුනර්ජීවන කලාව ගුරු කොට ගත්තකි.
2. උපස්තිථිවාදී ලක්ෂණ ගුරුකොට ගත්තකි.
3. ඉන්දීය දේශීය සම්ප්‍රදායන් ගුරුකොට ගත්තකි.
4. ශාස්ත්‍රාලීය යථාර්ථවාදය ගුරුකොට ගත්තකි.
5. පශ්චාත් උපස්තිථිවාදය ගුරුකොට ගත්තකි. (.......)

15. J අක්ෂරයෙන් දැක්වෙන සිතුවම,
1. ඊජිප්තු චිත්‍ර කලාවේ සමමිතික ලක්ෂණ වෙනස් වූ අවස්ථාවක් ලෙස සැලකේ.
2. ඊජිප්තු චිත්‍ර කලාවේ සමමිතික රීතින් රැකගත් අවස්ථාවක් ලෙස සැලකේ.
3. ඊජිප්තු කලාවට බටහිර බලපෑම් ලැබූ අවස්ථාවක් බව සැලකේ.
4. ග්‍රීක චිත්‍ර කලාවේ සමමිතික ලක්ෂණ වෙනස් වූ අවස්ථාවක් ලෙස සැලකේ.
5. ග්‍රීක චිත්‍ර කලාවේ සමමිතික රීතින් රැකගත් අවස්ථාවක් ලෙස සැලකේ. (.......)

◆ **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

16. යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර වල විශේෂත්වය වන්නේ,
1. මැමත් රූප බොහෝ සෙයින් ඇඳ තිබීමයි.
2. දළ සටහන් ලෙස සිතුවම් ඇඳ තිබීමයි.
3. ජීවි රූප වලට මිය ගිය සතුන් ඇඳ තිබීමයි.
4. පරිමානයන් ස්වභාවිකව ඇඳ තිබීමයි.
5. සතුන්ගේ ස්වාභාවික චලන ඉරියව් ඇඳ තිබීමයි. (.......)

17. අනුරපුර කුට්ටම් පොකුණ නිර්මාණය කර ඇත්තේ,
1. රජ සහ බිසවගේ ප්‍රයෝජනය සඳහා ය.
2. පිටතින් පැමිණෙන ආගන්තුකයින්ගේ ප්‍රයෝජනය සඳහා ය.
3. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා ය.
4. ප්‍රතිකාර ලබන්නන්ගේ ප්‍රයෝජනය සඳහා ය.
5. නගරවාසී ප්‍රභූන්ගේ ප්‍රයෝජනය සඳහා ය. (.......)


18. විදේශයකින් ශ්‍රී ලංකාවට ගෙන්වා ඇතයි සැලකෙන බුද්ධ ප්‍රතිමාව වන්නේ,
1. තොළුවිල බුද්ධ ප්‍රතිමාව ය.
2. මහ ඉලුප්පල්ලම බුද්ධ ප්‍රතිමාව ය.
3. පන්කුලිය බුද්ධ ප්‍රතිමාව ය.
4. සමාධි බුද්ධ ප්‍රතිමාව ය.
5. මාළිගාවිල බුද්ධ ප්‍රතිමාව ය. (.......)

19. මහාමයා දේවිය දුටු සිහිනය නම් වූ ඉන්දීය කැටයම,
1. අමරාවතී කලා ලක්ෂණ දක්වයි.
2. ගුප්ත කලා ලක්ෂණ දක්වයි.
3. පල්ලව කලා ලක්ෂණ දක්වයි.
4. මථුරා කලා ලක්ෂණ දක්වයි.
5. ගන්ධාර කලා ලක්ෂණ දක්වයි. (.......)

20. ඉන්දු නිම්න පූජක රුව මූර්ති ය,
1. ද්‍රවිඩ සම්භවයක් සහිත ජනතාව මෙහි ජීවත් වූ බවට සාධකයකි.
2. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය තුළ පූජකයින් සිටි බවට සාධකයකි.
3. මෙම ශිෂ්ටාචාරය තුළ මොන්ගෝලියානු ජනතාව විසූ බවට සාධකයකි.
4. මෙම ජනතාව අතර සුමේරියානු ජන කොටස් විසූ බවට සාධකයකි.
5. මෙම ජනතාව අතර ඉන්දියානු ජන කොටස් විසූ බවට සාධකයකි. (.......)


◆ **අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රශ්න වලට ඉදිරියේ ඇති වාස්තු විද්‍යාත්මක නිර්මාණ ඇසුරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

21. මෙහි දැක්වෙන්නේ,
1. ලක්සෝර් දේවස්ථානය ඉදිරිපිට ඡායාරූපයකි.
2. අබුසිම්බල් දේවස්ථානය ඉදිරිපිට ඡායාරූපයකි.
3. පාතිනන් දෙවොල ඉදිරිපිට ඡායාරූපයකි.
4. ප්‍රොපීලියා දෙවොල ඉදිරිපිට ඡායාරූපයකි.
5. සැන්විටාලේ දේවස්ථානය ඉදිරිපිට ඡායාරූපයකි.




(.......)

22. මෙහි දැක්වෙන්නේ,



1. ගුප්ත යුගයේ ගලින් නිම කළ සාංචි තොරණේ ඡායාරූපයකි.
2. මෞර්ය යුගයේ ගලින් නිම කළ සාංචි තොරණේ ඡායාරූපයකි.
3. සුංග යුගයේ ගලින් නිමකළ සාංචි තොරණේ ඡායාරූපයකි.
4. සතවාහන යුගයේ ගලින් නිමකළ සාංචි තොරණේ ඡායාරූපයකි.
5. පල්ලව යුගයේ ගලින් නිම කළ සාංචි තොරණේ ඡායාරූපයකි. (.......)

23. මෙහි දැක්වෙන විහාර භූමියේ,



1. මෞර්ය යුගයට අයත් ඇත්රූප කැටයම ඇත.
2. ගුප්ත යුගයට අයත් ඇත්රූප කැටයම ඇත.
3. ගුප්ත යුගයට අයත් මිනිසා සහ අශ්ව හිස කැටයම ඇත.
4. පල්ලව සම්ප්‍රදායට අයත් පෙම් යුවල කැටයම ඇත.
5. පල්ලව සම්ප්‍රදායට අයත් මිනිසා සහ අශ්ව හිස කැටයම ඇත. (.......)

24. මෙම ගෘහ නිර්මාණය මධ්‍යයේ,



1. ධාන්‍යාකාර හැඩයෙන් යුත් කුඩා දාගැබකි.
2. බුබ්බුලාකාර හැඩයෙන් යුත් කුඩා දාගැබකි.
3. ඝණ්ටාකාර හැඩයෙන් යුතු කුඩා දාගැබකි.
4. පද්මාකාර හැඩයෙන් යුත් කුඩා දාගැබකි.
5. ආම්ලාකාර හැඩයෙන් යුත් කුඩා දාගැබකි. (.......)

25. මෙහි දැක්වෙන ගොඩනැගිල්ලට,



1. මහල් හතක් තිබූ බව මහා වංශයේ සඳහන් වේ.
2. මහල් පහක් තිබූ බව මහාවංශයේ සඳහන් වේ.
3. මහල් හතක් තිබූ බව චූලවංශයේ සඳහන් වේ.
4. මහල් පහක් තිබූ බව චූලවංශයේ සඳහන් වේ.
5. මහල් නවයක් තිබූ බව චූලවංශයේ සඳහන් වේ. (.......)

- **අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් K, L, M, N, O යන චිත්‍ර ඇසුරෙන් තෝරන්න.**



**K**



**L**



**M**



**N**



**O**

26. K අක්ෂරයෙන් දැක්වෙන කැටයම,
1. ඉසුරුමුණියේ රන්මසු උයනේ ගලක කැටයම් කර ඇත.
2. ඉසුරුමුණියේ පිහිටි ගලේ ඉහළ කොටසේ කැටයම් කර ඇත.
3. ඉසුරුමුණියේ රන්මසු උයනේ පොකුණක් ආශ්‍රිතව කැටයම් කර ඇත.
4. ඉසුරුමුණියේ පොකුණ අසල ගලෙහි කැටයම් කර ඇත.
5. ඉසුරුමුණියේ කෞතුකාගාරය තුළ දක්නට ලැබේ. (.......)


27. L අක්ෂරයෙන් දක්වා ඇත්තේ ඉන්දු නිම්න ශිෂ්ඨාචාරයට අයත්,
1. රුක් දෙවියෝ නමැති මුද්‍රාවය.
2. යෝගාසන දේව රූපය නැමති මුද්‍රාවය.
3. ව්‍යාඝ්‍රයින් දෙදෙනෙකු සමඟ සටන් කරන මිනිසා මුද්‍රාවය.
4. අං සහිත දෙවියා නැමති මුද්‍රාවය.
5. මවු දෙවඟන නැමති මුද්‍රාවය. (.......)

28. M අක්ෂරයෙන් දැක්වෙන කැටයම් නිර්මාණය,
1. භාරුත් ස්තූපය කැනීමේදී හමු වූ අල්ප උන්නත කැටයමකි.
2. අමරාවතී ස්තූපය අවටින් හමු වූ අල්ප උන්නත කැටයමකි.
3. භාරුත් ගල්වැට කැටයම් අතර ඇති නිර්මාණයකි.
4. සාංචි තොරණේ උඩලිපතක දැකිය හැකි කැටයමකි.
5. සාංචි ගල්වැට අවටින් හමු වූ අල්ප උන්තන කැටයමකි. (.......)


29. N අක්ෂරයෙන් දක්වා ඇත්තේ,
1. ග්‍රීක මැටි බඳුනකි. 2. මිසර මැටි බඳුනකි. 3. ග්‍රීක කාලරූපි මැටි බඳුනකි.
4. ග්‍රීක රක්ත රූපී මැටි බඳුනකි. 5. මිසර කාලරූපි මැටි බඳුනකි. (.......)

30. O අක්ෂරයෙන් දැක්වෙන්නේ,
1. දුෂ්කර ක්‍රියාව දැක්වෙන ගන්ධාර සම්ප්‍රදායේ ප්‍රතිමාවක කොටසකි.
2. දුෂ්කර ක්‍රියාව දැක්වෙන මථුරා සම්ප්‍රදායේ ප්‍රතිමාවක කොටසකි.
3. දුෂ්කර ක්‍රියාව දැක්වෙන අමරාවතී සම්ප්‍රදායේ ප්‍රතිමාවක කොටසකි.
4. දුෂ්කර ක්‍රියාව දැක්වෙන ගුප්ත සම්ප්‍රදායේ ප්‍රතිමාවක කොටසකි.
5. දුෂ්කර ක්‍රියාව දැක්වෙන පල්ලව සම්ප්‍රදායේ ප්‍රතිමාවක කොටසකි. (.......)

- **අංක 31 සිට 35 දක්වා අසා ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර P, Q, R, S, T යන අක්ෂර වලින් දක්වා ඇති රූප සටහන් ඇසුරින් තෝරන්න.**


**P**


**Q**


**R**


**S**


**T**

31. P අක්ෂරයෙන් දැක්වෙන සිතුවම් කොටස අයත් සිතුවම ඇඳ ඇත්තේ,
1. නව කැලණි විහාරයේ ය. 2. පැරණි කැලණි විහාරයේ ය. 3. මුත්තු අම්මාන් කෝවිලේ ය.
4. කරගම්පිටිය විහාරයේ ය. 5. බෙල්ලන්විල විහාරයේ ය. (.......)

32. Q අක්ෂරයෙන් දැක්වෙන චිත්‍රයේ නිර්මාණ ශිල්පියා,
1. එම්. සාර්ලිස් මහතා ය. 2. සෝමබන්දු විද්‍යාපති මහතා ය.
3. සොයිලියස් මැන්දිස් මහතා ය. 4. ඒ.සී.ජී.එස්. අමරසේකර මහතා ය.
5. ජේ.ජී. බිලිං මහතා ය. (.......)

33 R අක්ෂරයෙන් දැක්වෙන සිතුවම් කොටස,
1. යුරෝපීය ලක්ෂණ ගුරුකොටගත් එම්. සාර්ලිස් ශිල්පියාගේ කුසලතාවය ප්‍රකට කරයි.
2. පෙරදිග රීතින් ගුරුකොටගත් සෝලියස් මැන්දිස් ශිල්පියාගේ කුසලතාවය ප්‍රකට කරයි.
3. සනිකවාදී ලක්ෂණ ගුරුකොටගත් සෝලියස් මැන්දිස් ශිල්පියාගේ කුසලතාවය ප්‍රකට කරයි.
4. පෙරදිග රීතීන් ගුරුකොට ගත් ස්ටැන්ලි අබේසිංහ ශිල්පියාගේ කුසලතාවය ප්‍රකට කරයි.
5. පෙරදිග රීතීන් ගුරුකොටගත් එච්.ඒ. කරුණාරත්න ශිල්පියාගේ කුසලතාවය ප්‍රකට කරයි.
(.......)

34. S අක්ෂරයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවමක් වන,
1. බිල්ලෑව ගුහාවේ ඇත් රූපය දැක්වේ. 2. දොරවක කන්ද ගුහාවේ ඇත් රූපය දැක්වේ.
3. තන්තිරිමලේ ගුහාවේ ඇත් රූපය දැක්වේ. 4. වෙට්ටම්බුගල ගුහාවේ ඇත් රූපය දැක්වේ.
5. වෙස්සගිරි ගුහාවවේ ඇත් රූපය දැක්වේ. (.......)

35. T අක්ෂරයෙන්,
1. පාරාවෝවරුන්ගේ දඩයම් දර්ශනය ඇතුළත් සිතුවමක කොටසක් දැක්වේ.
2. පාරාවෝවරුන්ගේ යුද්ධ ජයග්‍රහණ ඇතුළත් සිතුවමක කොටසක් දැක්වේ.
3. පාරාවෝවරුන්ගේ භෝජන සංග්‍රහ ඇතුළත් සිතුවමක කෙටසක් දැක්වේ.
4. මිසරයේ කෙත්වතු පිළිබඳ සිතුවමක කොටසක් දැක්වේ.
5. මිසරයේ ආගමික දර්ශන පිළිබඳ සිතුවමක කොටසක් දැක්වේ. (.......)

- **අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.**



36. මෙම සිතුවම ඇඳි ශිල්පියා,
1. ඩේවිඩ් ජේන්ටර්ය. 2. මයිකල් ආන්ජිලෝය. 3. එඩ්ගා ඩෙගාය.
4. රෆායෙල් සෙන්සියෝ ය. 5. ලියනාඩෝ ඩාවින්චි ය. (.......)

37. මෙම සිතුවම නම්කොට ඇත්තේ,
1. පර්නාසස් ලෙස ය. 2. ඇතන්ස් ගුරු කුලය ලෙස ය.
3. ඇල්බා මැඩෝනා ලෙස ය. 4. පර්වත මස්තකයේ දේව මැණියෝ ලෙස ය.
5. ලොකෝත්පත්ති කතාව ලෙස ය. (.......)

38. මෙම සිතුවම,
1. දාර්ශනික පාසලක් තේමා කොට ගෙන ඇඳ ඇත.
2. ආගමික අවස්ථාවක් තේමා කොට ගෙනෙ ඇඳ ඇත.
3. විනෝදයෙන් පසුවන අවස්ථාවක් තේමා කොටගෙන ඇඳ ඇත.
4. විවේකයෙන් පසුවන අවස්ථාවක් තේමා කොටගෙන ඇද ඇත.
5. කාව්‍ය ශාස්ත්‍රයෙහි යෙදී සිටින අවස්ථාවක් තේමාකොට ඇඳ ඇත. (.......)

39. මෙම සිතුවමට,
1. ග්‍රීක රෝම කලා මූලයන් භාවිතයට ගෙන ඇති බව දැකිය හැක.
2. මිසර කලා මූලයන් භාවිතයට ගෙන ඇති බව දැකිය හැක.
3. රෝම කලා මූලයන් භාවිතයට ගෙන ඇති බව දැකිය හැක.
4. ග්‍රීක කලා මූලයන් භාවිතයට ගෙන ඇති බව දැකිය හැක.
5. යුරෝපීය ස්වාභාවිකවාදී කලා මූලයන් භාවිතයට ගෙන ඇති බව දැකිය හැක. (.......)

40. මෙම සිතුවම සඳහා ශිල්පියා,
1. සංගත වර්ණ සංයමයෙන් භාවිතා කර ඇත.
2. විසංගත වර්ණ සංයමයෙන් භාවිතා කර ඇත.
3. සංගත හා විසංගත වර්ණ මනා සංයමයකින් භාවිතා කර ඇත.
4. ඒක වර්ණ ප්‍රභේද මනා සංයමයකින් භාවිතා කර ඇත.
5. විවිධ වර්ණ ප්‍රභේද මනා සංයමයකින් භාවිතා කර ඇත. (.......)

## 12 ශ්‍රේණිය - චිත්‍ර I
## II කොටස

- මෙය අනු කොටස් තුනකින් සමන්විතය.
- එක් කොටසකින් ප්‍රශ්නය බැගින් තෝරාගෙන ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.
  (අවශ්‍ය තැන්හි පිළිතුරු සචිත්‍ර කිරීම ඔබට වාසිදායක වේ)

### 'අ' කොටස
### චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය
### ශ්‍රී ලංකාව

01. යුරෝපීය ස්වභාවිකවාදී චිත්‍ර සම්ප්‍රදායේ ලක්ෂණ අනුගමනය කරමින් චිත්‍ර නිර්මාණය කරන ලද 20 වන සියවසේ මුල් භාගයේ ලංකාවේ ජනප්‍රිය විහාර සිත්තරා ලෙස එම්. සාර්ලිස් මහතා හඳුන්වා දිය හැක.
   i. එම් සාර්ලිස් මහතා විසින් චිත්‍ර නිර්මාණය කරන ලද විහාරස්ථාන 04 ක් නම් කරන්න. (ල. 04)
   ii. බෞද්ධ ජනතාවගේ බොදු බැතිය වර්ධනය කරලීමට එම්. සාර්ලිස් මහතාගේ ලිතෝ මුද්‍රණ චිත්‍ර බලපෑ ආකාරය කෙටියෙන් හඳුන්වන්න. (ල.06)
   iii. එතෙක් පැවති පන්සල් චිත්‍ර කලාව වෙනසකට භාජනය කිරීම සඳහා එම්. සාර්ලිස් මහතාගේ චිත්‍ර ශෛලිය බලපෑ ආකාරය නිදසුන් දෙමින් විමසීමක් කරන්න. (ල. 10)

02. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් කලාව පිළිබඳ විමසා බැලීමේදී විවිධ ප්‍රදේශ වලින් හමුවී ඇති ගල් ගුහා සහ ආනත ගල් පර්වත වල එකල ජීවත් වූ මානවයා විසින් අඳින ලද සිතුවම් හෝ කුරුටු සටහන් හඳුනාගෙන ඇත.
   i. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් සිතුවම් හෝ කුරුටු සටහන් දක්නට ලැබෙන ස්ථාන 04 ක් නම් කරන්න. (ල.04)
   ii. ප්‍රාග් ඓතිහාසික මානවයා තම සිතුවම් ඇඳීම සඳහා යොදාගත් ශිල්ප ක්‍රම පිළිබඳව කෙටි හැඳින්වීමක් කරන්න. (ල. 06)
   iii. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික මානවයා තම සිතුවම් නිර්මාණය සඳහා යොදාගෙන ඇති වස්තු විෂය සහ ඊට යොදා ගන්නා ලද වර්ණ මාලාවන් පිළිබඳ සාකච්ඡා කරන්න. (ල. 10)

03. ශ්‍රී ලංකාවේ ඓතිහාසික වාස්තු විද්‍යා නිර්මාණ අධ්‍යයනය කිරීමේදී අනුරාධපුර සහ පොළොන්නරු යුගවලට අයත් ගොඩනැගිලි වලට හිමි වනුයේ විශේෂ ස්ථානයකි.
   i. අනුරාධපුර යුගයට අයත් බෞද්ධ ගොඩනැගිලි 04 ක් නම් කරන්න. (ල. 04)
   ii. අනුරාධපුර යුගයට අයත් බෞද්ධ ගොඩනැගිලි සහ පොළොන්නරු යුගයට අයත් බෞද්ධ ගොඩනැගිලි එකිනෙක වෙනස්කම් හා විදෙස් බලපෑම පිළිබඳව වෙනස කෙටියෙන් සඳහන් කරන්න. (ල. 06)
   iii. ''වටදාගේ වූ කලී අගනා කලා නිර්මාණයකි.'' පොළොන්නරු වටදාගෙය ඇසුරින් මෙම කියමන සනාථ කරන්න. (ල.10)

### 'ආ' කොටස
### චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය
### ඉන්දියාව

04. ක්‍රි.පූ. 3000 තරම් ඈත ඉතිහාසයට උරුමකම් කියන ඉන්දු නිම්න ශිෂ්ටාචාරය පිළිබඳව පුරා විද්‍යාත්මක කැනීම් වලදී හමු වූ මෙවලම් අතර කලා නිර්මාණ හමු වුයේ ඉතා මද වශයෙනි.
   i. ඉන්දු නිම්න ශිෂ්ටාචාරයෙන් හමු වූ මූර්ති 04 ක් නම් කරන්න. (ල.04)
   ii. ඉන්දු නිම්න වැසියන් තුළ විවිධ වූ ඇදහිලි හා විශ්වාස පැවති බව හමුවී ඇති මූර්ති සහ මුද්‍රා ඇසුරින් විමසන්න. (ල. 06)
   iii. ඉන්දු නිම්න ශිෂ්ටාචාරය කැණීමේදී සනාථ වූ කරුණු අනුව එවකට එහි දියුණු වාස්තු විද්‍යාවක් පැවති බව සනාථ වේ. උදාහරණ සහිතව එම කියමන සනාථ කරන්න. (ල.10)

05. මධ්‍යම භාරතයේ කඳු ගැටයක් මත ඉතා රමණීය පරිසරයක ඉදි වූ සාංචි ස්ථූපය ඉන්දියාවේ කලාගාරයක් බඳු වූ ස්ථානයකි.

i. සාංචි කලාකරුවා කැටයම් නිර්මාණයේදී බුද්ධ චරිතයේ සිද්ධි යොදාගන්නා ලදී. අවස්ථා 04 ක් ලියන්න. (ල.04)

ii. සාංචි තොරණේ දල සටහනක් ඇඳ එහි කොටස් නම් කරන්න. (ල.06)

iii. සාංචි කැටයම් ශිල්පියා තමාට ආවේනික වූ ශෛලියකින් යුතුව කැටයම් නිර්මාණය කර ඇත. ඔබ දන්නා කැටයම් නිදසුන් කොට දක්වමින් මෙම කියමන සනාථ කරන්න. (ල.10)

06. ක්‍රි.ව. 78 - 144 අතර කාලය තුළ කුෂාණ රාජ සමයේ ගන්ධාර දේශයේ ප්‍රථම වරට බුද්ධ ප්‍රතිමාව නිර්මාණය සිදුවිය. එනම් කණිෂ්ක රජු විසින් නිම වන කාසියක 'BODDO' යනුවෙන් එය සටහනක් වී ඇත.

i. ගාන්ධාර සම්ප්‍රදායට අයත් බුද්ධ ප්‍රතිමා 04 ක් නම් කරන්න. (ල.04)

ii. ගාන්ධාර ප්‍රතිමාවල දක්නට ලැබෙන පොදු ලක්ෂණ පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ල.06)

iii. ගාන්ධාර ප්‍රතිමා වල දක්නට ලැබෙන ලක්ෂණ වලට වඩා මථුරා ප්‍රතිමාවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ කරුණු වශයෙන් ලියන්න. (ල.10)

**'ඉ' කොටස**

## චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය

**යුරෝපය**

07. ක්‍රි.පූ. 3000 තරම් ඈත ඉතිහාසයකට නෑකම් කියන නයිල් ගං මිටියාවතේ පිහිටි මිසර ශිෂ්ටාචාරය කලා නිර්මාණ රැසකට උරුමකම් කියන්නකි.

i. මිසර මූර්ති 04 ක් නම් කරන්න. (ල.04)

ii. ඔබ නම් කරන ලද එක් මූර්තියක් පිළිබඳව කෙටි සටහනක් ලියන්න. (ල.06)

iii. මිසර චිත්‍ර කලාවේ ශෛලිය පිළිබඳ 'කුරුළු දඩයම' (Following Scene) නමැති සිතුවම ඇසුරින් විස්තර කරන්න. (ල.10)

08. ඉතාලියානු පුනරුද කලාවේ විශිෂ්ට කලාකරුවකු ලෙස සැලකෙන 'මයිකල් ඇන්ජිලෝ' (Michelangilo) මූර්ති කලාවට මෙන්ම චිත්‍ර කලාවටද උපන් හපන්කම් දැක්වූ ශිල්පියෙකි.

i. මයිකල් ඇන්ජිලෝ විසින් නිර්මානය කරන ලද සිතුවම් දෙකක් සහ මූර්ති දෙකක් නම් කරන්න. (ල.04)

ii. මයිකල් ඇන්ජිලෝගේ එක් මූර්තියක් පිළිබඳව කලාත්මක ඇගයීමක් කරන්න. (ල.06)

iii. මයිකල් ඇන්ජිලෝ සහ රෆායල් සෙන්සියෝර් යන ශිල්පීන් දෙදෙනාගේ සිතුවම් සැසඳීමේදී දක්නට ලැබෙන වෙනස්කම් පිළිබඳව කරුණු වශයෙන් තොරතුරු දක්වන්න. (ල.10)

09. පුනරුද කාලසීමාවට අයත් කලා ශිල්පීන් අතර පුරෝගාමී චිත්‍ර ශිල්පියකු ලෙස සැලකෙන ලියොනාඩෝ ඩාවින්ච් (Leonardo Da vinci) මූර්ති කලාවට, ගෘහ නිර්මාණ කලාවට, සංගීතය, ඉංජිනේරු විද්‍යාව, ගණිතය ආදී අංශ රැසක විශේෂඥයෙකි.

i. ලියනාඩෝ ඩාවින්චිගේ සිතුවම් දෙකක් නම් කරන්න. (ල.04)

ii. ඔබ විසින් නම් කරන ලද එක් සිතුවමක් පිළිබඳව කෙටි සටහනක් ලියන්න. (ල.06)

iii. ලියනාඩෝ ඩාවින්ඩ් ශිල්පියාගේ නිර්මාණ සුවිශේෂී කලා නිර්මාණ ලෙස සැලකීමට තුඩුදුන් හේතු ඔහුගේ නිර්මාණ ඇසුරින් විමසීමක් කරන්න. (ල.10)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

| 51 | S | II |
|---|---|---|

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය .................................. චිත්‍ර II කාලය පැය තුනයි

<u>අයදුම්කරුවන්ට උපදෙස්</u>

- ඔබේ නම/විභාග අංකය ඔබ චිත්‍රය අඳින කඩදාසියේ පසුපිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට එය වියළී තිබීම වැදගත්ය. තෙත් චිත්‍ර එකිනෙකට ඇලීමට ඉඩ ඇති බැවින්, එය ඔබට අවාසි විය හැකිය.

## <u>ස්වභාවිකත්ව අධ්‍යනය හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය</u>

- කඩදාසි තලය අර්ථවත්ව භාවිතා කරමින් චිත්‍රය සම්පිණ්ඩනය කරන්න.
- ද්‍රව්‍යවල හා පැලැටියේ අතු රිකිල්ලේ ගති ලක්ෂණ, මතුපිට ස්වභාවය, පරිමාණය, ඇස්මට්ටම, ත්‍රිමාණ ලක්ෂණ හා පර්යාවලෝක රීති පිළිබඳව සැළකිලිමත් වන්න.
- ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන ආකාරයට ඇඳ ඒ මත ආලෝකය හා අඳුර පතිත වී ඇති අයුරු සැළකිල්ලට ගෙන වර්ණ කරන්න.
- වර්ණ මාධ්‍ය හැසිරවීමේ ශිල්ප ක්‍රම අර්ථවත්ව භාවිතා කරන්න.
- ද්‍රව්‍ය සමූහයට ගැලපෙන වර්ණවත් පසුබිමක් යොදන්න.
- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සම්පිණ්ඩනයට ගැළපෙන පරිදි වෙනස් කර ගැනීමට පිළිවන
- දිය සායම්, පෝස්ටර්, සායම්, කුඩු සායම්, පැස්ටල් හෝ මෙම මාධ්‍ය මිශ්‍රිතව හෝ භාවිතා කළ හැකිය.

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

51 | S | III

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

## Second Term Test - Grade 12 - 2019

විභාග අංකය ..................................  චිත්‍ර III  කාලය පැය තුනයි

උපදෙස් :-

- උත්තර පත්‍රයේ පිටුපස ඔබගේ විභාග අංකය සහ ප්‍රශ්න අංකය පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිතා කළ හැකිය. (ෆෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.)
- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ'කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණ චිත්‍රයක් අඳින්න.

### 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. විඩා දැනෙන දහවල් කාලයේ හේනේ ගස් සෙවනක් යටට වී දිවා ආහාරය ගන්නා ගොවි ගෙවිලියෝ
2. පරිසරය කලබලයි නගරයේ බස්නැවතුම් පලක එහා මෙහා යන මඟී ජනතාව / මුහුද රළ නැගෙන වෙරළේ තම වාරය එනතුරු බලා සිටින මාළු වෙළෙන්දෝ
3. පරිසරයම උත්සව සිරියගෙන ඇති අළුත් අවුරුද්දේ ප්‍රීතියෙන් අවුරුදු සිරිත් ඉටුකරන පුංචි පවුලක් චිත්‍රයට නගන්න.

### 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

4. නිර්මාණාත්මක සත්ව හැඩයක් යොදා ගනිමින් ආලින්දයේ තැබීමට සුදුසු බඳුනකට සැලැස්මක් නිර්මාණය කරන්න.
5. සිංහල සැරලිසි රටාවක් යොදා ගනිමින් ග්‍රීල් රාමුවකට (ජනෙල් රාමුවකට) සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.
6. ළමා අවශ්‍යතාවයන්ට ගැලපෙන වර්ණ හා රටා භාවිතා කරමින් ව්‍යාප්ත සැරසිල්ලක් නිර්මාණය කරන්න.

### 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර නිර්මාණය

7. අළුතින් වෙළඳපොළට හඳුන්වා දීමට නියමිත පළතුරු බීම බෝතලයකට සුදුසු ලේබලයක් නිර්මාණය කරන්න.
8. පාසල් නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් නිර්මාණය කරන්න.
9. 'මතින් වැනසෙන ළමා ජීවිත' තේමාවට උචිත පෝස්ටරයක් නිර්මාණය කරන්න.

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**දෙවන වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය**
**චිත්‍ර කලාව I - පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | |
|---|---|---|---|
| **01.** - 2 | **11.** - 4 | **21.** - 1 | **31.** - 5 |
| **02.** - 3 | **12.** - 1 | **22.** - 4 | **32.** - 1 |
| **03.** - 1 | **13.** - 5 | **23.** - 5 | **33.** - 2 |
| **04.** - 4 | **14.** - 3 | **24.** - 2 | **34.** - 4 |
| **05.** - 5 | **15.** - 1 | **25.** - 3 | **35.** - 1 |
| **06.** - 4 | **16.** - 5 | **26.** - 4 | **36.** - 4 |
| **07.** - 5 | **17.** - 3 | **27.** - 3 | **37.** - 1 |
| **08.** - 1 | **18.** - 2 | **28.** - 2 | **38.** - 5 |
| **09.** - 4 | **19.** - 1 | **29.** - 3 | **39.** - 1 |
| **10.** - 2 | **20.** - 3 | **30.** - 1 | **40.** - 3 |

**චිත්‍ර කලාව I පත්‍රය**
**I කොටස 1 x 40 = 40**
**II කොටස 60 = <u>60</u>**
**100**

**I පත්‍රය සඳහා** = **ලකුණු** 100 **II පත්‍රය** = **ලකුණු** 100 **III පත්‍රය** = **ලකුණු** 100 = 300/3

## II කොටස

01. (i)
1. මාලිගාකන්ද - විද්‍යෝදය පිරිවෙන් විහාරය.
2. ග්‍රෑන්ඩ්පාස් හි - ජයතිලකාරාමය.
3. කොළඹ - ඉසිපතනාරාමය.
4. ඊරියවැටිය - සුදර්ශනාරාමය.
5. පොතුපිටිය - පූජාරාමය
6. බෝමිරිය - ගනේවත්ත විහාරය
7. තිඹිරිගස්යාය - අශෝකාරාමය.
8. දෙමටගොඩ - වේළුවනාරාමය.
9. පාන්තිය - මංගලාරාමය

(ii) * බෞද්ධ ජනතාවට මෙම සිතුවම් නවමු අත්දැකීමක් වීම.
* එතෙක් පැවති විහාර සිතුවම් කලාවට වඩා චිත්තාකර්ශණීය බවක් ඇතිවීම.
* ස්වභාවික හැඩතල සහ පැහැපත් වර්ණ යොදා තිබීම.
* මානව රූප, සළුපිළි, වාස්තු විද්‍යා අංග, භූමිදර්ශන බටහිර චිත්‍ර ශෛලිය අනුව යොදා තිබීම.
* යුරෝපීය ත්‍රිමාණ ලක්ෂණ ක්‍රමවේදය භාවිත කර තිබීම.
* බුදුසිරිතේ සිද්ධි ඉතා තාත්වික අයුරින් භක්තිය ඇති වන ලෙස නිර්මාණය කර තිබීම.

(iii) * එච්. සාර්ලිස් මහතාගේ ලිතෝ මුද්‍රණ චිත්‍ර ජනතාව අතර ප්‍රචලිත වීම නිසා ඊට ජන ආකර්ෂණය ඇති වීම.
* එතෙක් පැවති පන්සල්/විහාර චිත්‍ර කලාවේ දක්නට නොලැබුණු ඉතා සුන්දර මානව ඉරියව් අඟපසඟ මෙන්ම වස්ත්‍රාභරණ, වාස්තු විද්‍යා අංග, භූමි දර්ශන තාත්වික අයුරින් නිම කර තිබීම.
* එක් කාලයකට එක් සංසිද්ධියක් පමණක් චිත්‍රණය කර තිබීම.
* ඉන්දියානු බෞද්ධ ආගමික පරිසරය එම සිතුවම් වල දක්නට ලැබීම.
* එතෙක් පැවති චිත්‍ර කලාව වෙනුවට බටහිර චිත්‍ර ශෛලියේ ලක්ෂණ ඇතුළත් තාත්වික චිත්‍ර නිර්මාණය වීම.
* මෙම කරුණු හේතු කර ගනිමින් බෞද්ධ ජනතාවගේ වැඩි ආකර්ෂණයක් මෙම සිතුවම් කලාව කෙරෙහි බලපා තිබීම.

02. (i) * කුරුවිට එක්නැලිගොඩ ග්‍රාමයේ - බටදොඹලෙන.
* කෑගල්ල දිස්ත්‍රික්කයේ දොරවත් ග්‍රාමයෙහි පිහිටි - දොරවක ලෙන.
* මඩකලපුව දිස්ත්‍රික්කයේ - කඳුරුපොකුණ.
* අම්පාර දිස්ත්‍රික්කයේ පීල්ලගොඩ - රජගලකන්ද.
* අනුරාධපුර දිස්ත්‍රික්කයේ තන්තිරිමලේ බිල්ලෑව- ආඬියා ගල්කන්ද.
* අම්පාර දිස්ත්‍රික්කයේ ගොනාගොල්ල, අලුගල්ගේ, බුදුගල්ගේ, කුඩුම්බිගල, පියංගල, ලිහිණියාගල, මගුල් මහා විහාරය, හක්බෙලිකන්ද, වෙට්ටම්බුගල, ආරංගොඩ ගල්ගේ.

(ii) * රේඛාමය චිත්‍ර නිර්මාණය (Line Drawing)
* ගල් බිත්ති සූරා නිර්මාණය කරන ලද ක්‍රමවේදය (උත්තීරණ) (Engraving)
* මුද්‍රා තබන ලද අත් සලකුණු තැබීම යනාදී ක්‍රමවේදයන්ට අනුව ඔවුන් තම සිතුවම් නිර්මාණය කර ඇත.

(iii) * ප්‍රාග් ඓතිහාසික මානවයා අවට පරිසරයේ තමා දුටුදේ සටහන් කිරීමට පෙළඹී ඇත.
* විවිධ ඉරියව්වලින් යුතු මානව රූප ඇඳීමට පෙළඹී තිබේ.
* තමා ජීවත්වන පරිසරයේ දක්නට ලැබෙන සත්ව රූප ඇඳීමට පෙලඹී ඇත. ඇතා/මුවා/ තලගොයා/අලියා යන සත්ව රූප කුරුටුගා ඇත.
* ඔවුන් මෙම සිතුවම් සඳහා වර්ණ ලෙස භාවිතා කර ඇත්තේ දේශීය වර්ණය. එනම් කළු, අළු පැහැය, රත් පැහැය, රතට හුරු කහ පැහැය, සුදු පැහැය.
* ඇතැම් තැන්වල ජ්‍යාමිතික හැඩ නිර්මාණය කර ඇත.

03. (i) * ආසන ඝර * පධානඝර * ජන්තාඝර * බෝධිඝර * උපෝසථඝර

(ii) අනුරාධපුර යුගයේ බෞද්ධ ගොඩනැගිලි සහ පොළොන්නරු යුගයේ බෞද්ධ ගොඩනැගිලි අතර වෙනසක් දක්නට ඇත. අනුරපුර මුල් භාගයේදී කරන ලද බොහෝ බෞද්ධ ගොඩනැගිලි කළු ගල් සහ ගඩොල් ආධාරයෙන් නිමකර ඇත. පොළොන්නරු යුගයේ ඉදිකරන ලද බෞද්ධ ගොඩනැගිලි සඳහා ගඩොල් භාවිතය වැඩි වශයෙන් දක්නට ලැබේ. වහලය ගඩොල් ආධාරයෙන් නිම කර තිබීම පොළොන්නරු යුගයේ ගොඩනැගිලිවල විශේෂත්වයකි. පොළොන්නරු ගොඩනැගිලි කෙරේ දකුණු ඉන්දීය බලපෑම වැඩි වශයෙන් බලපා ඇති අතර, අනුරපුර ගොඩනැගිලි සඳහා භාවිතා කර ඇත්තේ උතුරු ඉන්දියානු ගෘහ නිර්මාණ කලාවයි. පොළොන්නරු වාස්තු විද්‍යා අංගයක් ලෙස විමාන සහිත බිත්ති වලින් යුතු වීම, අධික ලෙස බොරදම් හා පැන්නුම් එම ගොඩනැගිලි තුළ දක්නට ලැබීම, උස් වූ වේදිකාවක් මත ගොඩනැගිලි ඉදිකර තිබීම, ගඩොලින් නිම කරන ලද ශිඛර සහිත වහල දක්නට ලැබීම සඳහන් කලහැක.

(iii) * පොළොන්නරු පුදබිමේ දළදා මළුවට ඇතුළු වන ස්ථානයේ දක්නට ලැබේ.
* කුඩා චෛත්‍යයක් වටා වේදිකා දෙකකින් යුතුව ඉදිකරන ලද වෘත්තාකාර ගොඩනැගිල්ලකි.
* මෙහි මළුවට නැගීමට පඩි පෙළ සතරක් යොදා ඇත. සෑම දොරටුවල මුරගල්, කොරවක්ගල්, සඳකඩ පහන් නිර්මාණය කර ඇත.
* චෛත්‍යය වටා ඒකකේන්ද්‍රීය ලෙස සිටුවන ලද ගල් කණු පේළි කිහිපයකි. ඒ වටා වෘත්තාකාර ගඩොලින් තනන ලද බැම්මකි.
* එම උස්වූ බිත්ති ඇතුල් පැත්තේ චිත්‍ර නිර්මාණය කර තිබෙන්නට ඇතැයි සැලකේ.
* උස් වූ බිත්තියට මඳක් පිටතින් කැටයම් කරන ලද මිටි තාප්පයකි.
* පැතලි කළුගල් පුවරු භාවිතයෙන් තැනූ මෙම කැටයම් තල චතුරස්‍රාකාර කොටු රටාවකට අනුව කැටයම් කොට ඇති පෙති සතරේ බිනර මල් මෝස්තර දක්නට ඇත.
* චෛත්‍ය වටා සතර දිශාවට මුහුණලා බුද්ධ ප්‍රතිමා සතරකි.
* මෙය නිර්මාණය කරවන ලද්දේ නිශ්ශංකමල්ල රජු බව ලිඛිත සටහනක් දක්නට ඇත.

04. (i) * හරප්පාවෙන් හමු වූ පිරිමි මිනිස් කවන්ද රුව.
* මොහෙන්ජොදාරෝවෙන් හමුවූ ලෝකඩ නළඟන රුව.
* හරප්පාවෙන් හමුවූ නර්තන විලාසය දැක්වෙන කවන්ද රුව.
* මොහෙන්ජොදාරෝවෙන් හමුවූ පූජක රූපය.
* මවු දෙවඟන මූර්තිය.

(ii) * ඒකාංශ වස්ත්‍රයක් පොරවා ගත් පූජක රූපයෙන් කිසියම් ආගමික නායකයෙකු පිළිබඳව අදහසක් නිරූපණය කරයි.
* ලෝකඩ නළඟන රුවින් දෙවොල් නිළියකගේ අදහසක් ඉස්මතු කරන බව විද්වත් මතය වේ.
* එකල වෘක්ෂ වන්දනා පැවති බව ඒ පිළිබඳව කැටයම් කර ඇති මුද්‍රාවකින් සනාථ වේ.
* අං සහිත දෙවියා මුද්‍රාවෙන් හින්දු දහම පිළිබඳව අදහසක් ඉස්මතු වන බව විද්වත් මතයයි.
* හමුවී ඇති මුද්‍රාවල කියවිය නොහැකි එම සංස්කෘතියට පමණක් ආවේණික වූ භාෂාවක් සටහන් කර ඇත. මෙයින් කිසියම් ආගමික චර්යාවක් නිරූපණය කරන්නේ යැයි විද්වත් මතය වේ.

* මාතෘ දෙවඟන පිදීම තුළින් මාතෘ මූලික සමාජයක් පැවැති බව සනාථ වෙයි.
* වෘක්ෂ දේවතාවා සහිත මුද්‍රාව ඇසුරින් කිසියම් දෙවියකු අදහන පිරිසක් වෙසෙන්නට ඇතැයි සිතිය හැක.

(iii) * ක්‍රි.පූ. 3000 දී ඉදි වූ ඉන්දු නිම්න ශිෂ්ටාචාරයේ දියුණු වාස්තු විද්‍යාවක් පැවතී ඇත.
* ප්‍රමාණ තුනකින් යුතු ගඩොල් මේ සඳහා භාවිතා කර ඇත.
* සෑම ගොඩනැගිල්ලක ම බිත්ති තනා ඇත්තේ පුළුල් ලෙසටය. තට්ටු වශයෙන් ගොඩනැගිලි ඉදිකර ඇත.
* බදාම ආලේප කොට ඔපමට්ටම් කර ඇත.
* සෑම නිවසකම ප්‍රධාන දොරටුව පාර දෙසට විරුද්ධව යොදා ඇත. සෞඛ්‍ය ආරක්ෂා ක්‍රමයක් ලෙස සලකයි.
* මෙහි ගාඩනැගිලිවල පියසි දක්නට නැත. ඒවා දැවයෙන් තනා තිබෙන්නට ඇත.
* මැකේ නැමැති ඉතිහාසඥයා පවසනුයේ මෙහි වහල පැතලි තල ලෙස තනා තිබෙන්නට ඇති බවයි.
* ඇතැම් නිවෙස්වල උඩු මහන්තල තනා ඇත.
* ගොඩනැගිලි වල ජනෙල් නොමැති අතර වාතය ලබා ගැනීම සඳහා වා කවුළු තනා ඇත.
* මැද මිදුල් සහිත නිවෙස් හමු වී ඇත. වැසිකිළි සහ ලිං ආදිය සැලසුම් සහගතව තනා ඇත. ජලය බැසයාමට නල මාර්ග යොදා ගඟට අපද්‍රව්‍ය බැහැර කර ඇත.
* මෙහි ධාන්‍යාගාර, මුළුතැන්ගෙවල් හමුවී ඇත.
* ඉහල මාලයට නැගීමට තනනලද තරප්පුපේලි හමුවී ඇත.

05. (i) * මහබිනික්මන
* සංකස්සපුර දේවාරෝහන ය.
* කපිලවස්තුපුර වැඩීම.
* ජටිල දමනය.

(ii) සාංචි තොරණේ දළ සටහනක් ඇඳ එහි කොටස් නම් කර ඇත්නම් අදාළ ලකුණු ලබා දෙන්න.

(iii) * සාංචි කැටයම් ශිල්පියා මාධ්‍ය කොට ගන්නා ලද්දේ කළු ගලයි.
* ගල් කණු හතරැස් සහ දිගටි පනේලවල, තිරස් පුවරුවල කැටයම් කර ඇත.
* අඛණ්ඩ කථන මාධ්‍යයෙන් කැටයම් කර ඇත.
* වමේ සිට දකුණට කතාව කියවෙන ආකාරයට දක්වා ඇත. දකුණේ සිට වමට ද ඇතැම් අවස්ථාවල කතාව කියවේ. (උතුරු තොරණේ යටි ගල් පුවරුවේ වෙස්සන්තර ජාතකය නිදසුනකි)
* මිනිසුන්, සතුන්, ගස්වැල් තමාට ආවේණික රටාවකට අනුව නිර්මාණය කර ඇත. ගස්, ගංගා ආදිය ශෛලිගතව නිමකර ඇත.
* බුදුන් වහන්සේ සහ බෝධිසත්වයෝ මෙහි කැටයම් කර නැත.
* සාංචි කැටයම් ගැඹුරට හාරා ඇති අතර රූපයකට රූපයක් මුවා වන ලෙස කැටයම් කර ඇත.
නිදසුන් : ජද්දන්ත ජාතකය දැක්වෙන අවස්ථාව.
* බුදුන් වහන්සේ වෙනුවට සංකේත භාවිත කොට ඇත.

06. (i) * කණිෂ්ක රජුගේ රන් කාසියේ එක් පැත්තක දැක්වෙන බුදුපිළිමය.
* හෝටිමන්දාර් බුදුපිළිමය.
*බ්‍රෙගම් හි යමක මහා ප්‍රාතිහාර්යය දැක්වෙන පිළිමය.
* තක්ති බහී පිළිමය.
* සහරි බහ්ලෝල් පිළිමය.
* දුෂ්කර ක්‍රියාව දැක්වෙන පිළිමය.
* බුද්ධ ප්‍රතිමා ශීර්ෂය.

(ii) * මුහුණ ග්‍රීක ඇපලෝ හෙවත් හිරු දෙවියන් ගේ මුහුණේ ස්වරූපය ගැනීම.
* මදක් විවර වූ දිග දෙනෙත්.
* ලඹ සවන්, ඍජු නාසය, සිහින් තොල්.
* හිසකේ ස්වභාවික රැලි සහිත වීම.
* විශාල උෂ්ණීෂය.
* චීවරය ග්‍රීක ප්‍රභූ ඇඳුමට හා රෝම වංශාධිපතීන්ගේ ටෝගාවට සමාන වීම.
* සිවුරේ රැළි ඝනව ස්වභාවික ලෙස යෙදීම.

(iii) * චාම් බව සහ ජීවමාන බව.
* මද සිනහව සහ ප්‍රසන්න පෙනුම.
* ලඹ සවන් හා ඌර්ණරෝම දාතුව දැක්වීම.
* අක්බඹරු හිසකෙස් දැක්වීම.
* එක් උරයක් වැසූ ඇඟට ඇලුණු චීවරය.
* චීවරයේ රිද්මානුකූල රැලි යොදා තිබීම.

* පිරිපුන් හා මටසිලිටි අඟපසඟ.
* අලංකාර ප්‍රභා මණ්ඩලය.
* ආසන ක්‍රම මුද්‍රා පැහැදිලිව දැක්වීම.

07. (i) * මෙන් කුරේ රජු හා ඔහුගේ බිරිය ප්‍රතිමාව.
* ස්ක්‍රයිබ් ප්‍රතිමාව.
* නෙෆර්ටිටි උඩුකය මූර්තිය.
* ස්ෆිනික්ස් ප්‍රතිමාව

(ii) **<u>මෙන්කුරේ රජු හා ඔහුගේ බිරිය ප්‍රතිමාව.</u>**
* ක්‍රි.පු. 2478 පමණ අයත් යුගල මූර්තියකි. සිටගත් ඉරියව්වෙන් සිටින අතර දෙදෙනාම වම් පාදය ඉදිරියට තබා ඇත.
* පිරිමි රුව යටිකය පමණක් කෙටි වස්ත්‍රයක් ඇඳ ඇත.
* සාම්ප්‍රදායික හිස්වැස්ම දක්වා ඇත.
* පිරිමි රුව දෑත් පහලට යොදා අත් මිට මොලවා සිටී.
* බිසව ඔහුට ආසන්නව සිටින අතර ඇය ඇඳ සිටිනුයේ ගෙල සිට දෙපා දක්වා දිග ඇඳුමකි.
* බිරිය මෙන්කුරේ රජුගේ වම් බාහුවෙන් සහ දකුණු පස බඳෙන් අල්ලාගෙන සිටී.
* පිරිමි රුව ශක්තිසම්පන්න ලෙසද, ගැහැණු රුව සැහැල්ලු ලෙස ද නිමකර ඇත.
* මූර්තිය පූර්ණ වශයෙන් මතුවන ලෙස නෙළා නොමැත.

**<u>ස්ක්‍රයිබ් ප්‍රතිමාව :</u>**
* හුණු ගලෙන් පූර්ණ වශයෙන් නෙළා ඇත. පින්තාරු කර ඇත.
* ලේඛනයේ නියැලී සිටින්නෙක් මෙයින් දැක්වේ
* ඉදිරිය බලා සිටින ඍජු හිඳි මූර්තියකි. දෙසවන් තරමක් විශාලයි.
* ස්වභාවිකවාදී ලක්ෂණ සමග යථාර්ථවාදී නිරීක්ෂණ පිහිටුවා ඇත.
* විචාරකයින් පවසන්නේ මෙම මූර්තිය ඉහළ වරප්‍රසාද සහිත ලියන්නකු ගේ රූපයක් බවයි.

**<u>නෙෆර්ටිටි උඩුකය මූර්තිය :</u>**
* 1345 දී පමණ තනා ඇත. උස අඟල් 19 යකි.
* කළුපැහැ හිස්වැසුමක් පැළඳ ඉදිරියේ බලා සිටින තරුණ නෙෆර්ටිටි රැජිනගේ උඩුකය මෙයට විෂය වී ඇත.
* හුණුගල් සැකසුම මත ස්ටකෝ බදාමයෙන් තනා ඒ මත වර්ණ ආලේප කර ඇත.
* පරමාදර්ශී ස්ත්‍රී සෞන්දර්ය මූර්තිමත් කරන මෙහි මුහුණේ මඳ සිනහව දක්නට ඇත.
* ජ්‍යාමිතික රූපී ස්වභාවය මෙහි දක්නට නැත.
* ගෙලෙහි මාලය, දිගටි හිස්වැස්ම මෙම මූර්තියට වඩාත් අලංකාරයක් ගෙන දෙයි.

**<u>ස්පිනික්ස් ප්‍රතිමාව :</u>**
* පාරා රජුන්ගේ බලපරාක්‍රමය දැක්වීමට මෙය ඉදිරි ඉදිකර ඇත.
* විශාල ග්‍රැනයිට් පාෂාණයෙන් නිමවා ඇත.
* මිනිස් හිසක් සහිත සිංහ සිරුරක් මෙයින් නිරූපණය වේ.
* අඩි හැටක් පමණ උසින් යුතු මූර්තියකි.

(iii) * සාම්ප්‍රදායික හා තාත්ත්වික චිත්‍ර ශෛලියේ සම්මිශ්‍රණයෙන් කරන ලද නිර්මාණයක.
* පැපිරස් ගස් පීරා යමින් කුරුලු දඩයමේ යෙදී සිටින වංශාධිපතියෙකු නිරූපණය කරයි.
* පැතලි වර්ණ භාවිතය.
* අවශ්‍ය චරිත ප්‍රමාණයෙන් විශාල කොට ඇඳීම.
* ශරීරය ඍජුදර්ශීවත්, හිස, පාද පාර්ශවදර්ශීවත් ඇඳ ඇත.
* චිත්‍රය පිටුපස මිසර රූපාක්ෂර හෙවත් හයිරොග්ලිෆික්ස් යොදා ඇත.
* බිත්තිය සිරස් තීරු වලට බෙදා එකම රේඛාවකට චිත්‍රය සම්පිණ්ඩනය කිරීම.
* පූසා, මත්ස්‍යයන්, පක්ෂීන් ඉතා තාත්විකව ඇඳ ඇත.

08. (i) සිතුවම් - * අවසාන විනිශ්චය සිතුවම * ආදම් මැවීම සිතුවම.
මූර්ති - * ඩේවිඩ් ප්‍රතිමාව * පියෙටා ප්‍රතිමාව * මෝසස් ප්‍රතිමාව

(ii) **<u>පියෙටා ප්‍රතිමාව (Pieta)</u>**
* කුරුසයෙන් බාන ලද ජේසුතුමාගේ මෘතශරීරය උකුල මත තබා ගෙන සිටින මරියතුමියගේ රුවයි.
* ''පියෙටා'' යන්නෙහි අර්ථය 'වැලපීම' යන්නයි.
* කිරිගරුඬ මාධ්‍යයෙන නෙලන ලද මූර්තියකි.
* මෙහි රූප ද්විත්වය සංරචනය කර ඇත්තේ පිරමීඩාකාර ආකෘතියක් තුළය.

* ජේසුතුමාගේ ශරීරයේ අප්‍රාණික ස්වභාවය, ඇන වලින් සිදුවූ තුවාල කැලැල්, මරියතුමියගේ අතට තෙරපෙන දකුණු බාහුව ආදී මානව ඉරියව් ඉතා දක්ෂ ලෙස නිර්මාණය කර ඇත.
* මරිය තුමියගේ මුහුණේ ඇත්තේ වැලපීමට වඩා භාවනාත්මක අවධානයකින් යුතුව හැඟීම් ප්‍රකාශනයකි.

**ඩේවිඩ් ප්‍රතිමාව (David):**
* ගොලායත් නම් යෝධයකු ගෙන් මිනිසුන් බේරා ගත් යොවුන් වීරයෙකු දැක්වෙන කිරිගරුඬ මූර්තියකි.
* ග්‍රීක සම්භාව්‍ය මූර්ති කලාවේ ඉතා ප්‍රකට ඉරියව්වක් වන එක් පාදයකට බර දී සිටගත් ඉරියව්ව මයිකල් ආන්ජිලෝ විසින් ඉතා සාර්ථකව භාවිතයට ගනු ලැබ තිබේ.
* මූර්තිය බිඳී යාම වැළැක්වීමට තාක්ෂණික ප්‍රයෝගයක් ලෙස දකුණු පයට සම්බන්ධ වූ ආධාරක කොටසකි.
* උස අඩි 17ක් වේ. උස නග්න රුවකි. කාය ව්‍යුහ ලක්ෂණ පිළිබඳ ශිල්පියා සතු විශාරදත්වය මනාව ප්‍රකට කෙරේ.
* මානව රූපයේ සිටගෙන සිටින ඉරියව්වට අවබෝධයෙන් යුතුව නිමකර තිබේ.
* වමතින් ගල් දුන්න අල්ලාගෙන සැහැල්ලු ඉරියව්වකින් සිටී. මුහුණේ ඉතා තීක්ෂණ, දූරදර්ශී බැල්මකි. අභියෝග දෙස කල්පනාකාරීව බලා සිටින බව ප්‍රකාශනයකි.

**මෝසෙස් ප්‍රතිමාව (Moses) :**
* දස පනත හා සම්බන්ධ මෝසෙස්තුමාගේ රුව මෙයින් දැක්වේ. දසපනත සංකේතවත් කිරීමට දකුණතේ ගල්පුවරුවක් දක්වා ඇත.
* මෙම මූර්තිය ප්‍රඥාවේ මෙන්ම බලයේද සංකේතයක් ලෙස නිරූපණය වී ඇත.
* ගැඹුරු පාණ්ඩිත්‍යයෙන් යුතු වයෝවෘද්ධ මුහුණක් මෝසෙස්ට යොදා තිබුණද ඔහුගේ ශරීරය මනා කාය බලයෙන් හා ශක්තිය යුතු බව පෙනෙන්නට තිබේ.
* ඔහු තේජාන්විත ඉරියව්වකින් වාඩි වී වාමාවර්තව හිස හරවා විමසුම් සහගත බැල්මකින් යුතුව සිටී.
* 11 වන ජූලියස් පාප්තුමාගේ සොහොන්ගැබ වෙනුවෙන් කරන ලද්දකි.

(iii) * මයිකල් ආන්ජිලෝගේ සිතුවම් වල මානව රූප රිද්මික ලෙස දැක්වූ අතර රෆායල්ගේ සිතුවම් වල මොලකැටි බව, සියුම් බව දැක්වීමට උත්සාහ කර ඇත.
* රෆායල්ගේ සිතුවම් කිසියම් ජ්‍යාමිතික ආකාරයකට අනුව ඇඳ තිබුනද මයිකල් ආන්ජිලෝගේ චිත්‍ර එසේ නැත.
* මයිකල් ආන්ජිලෝගේ චිත්‍ර වල මානව රූප ක්‍රියාකාරී බවින් වැඩි අතර, රෆායල්ගේ චිත්‍ර එසේ නොවේ.
* මයිකල් ආන්ජිලෝගේ සිතුවම් වලට වඩා දීප්තිමත් අමිශ්‍ර වර්ණ රෆායෙල්ගේ සිතුවම් වල දක්නට නැත.
* මයිකල් ආන්ජිලෝගේ සිතුවම් වලට වඩා රෆායල් ගේ මැඩෝනා සිතුවම් ප්‍රමාණයක් දක්නට ලැබීම.

09. (i) * අවසාන භෝජන සංග්‍රහය සිතුවම. * මරියතුමිය සහ කානේෂන් මල සිතුවම.
* ගිරි අරණේ මරිය මව්තුමිය සිතුවම. * මොනාලිසා සිතුවම

(ii) නම් කරන ලද සිතුවම පිළිබඳ ප්‍රමාණවත් කරුණු දක්වා ඇත්නම් අදාළ ලකුණු ලබා දෙන්න.

(iii) ලියනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ සුවිශේෂී කලා නිර්මාණ ලෙස සැලකීමට හේතු ලෙස,
* මානව රූපයේ නිවැරදි පරිමාණය දැක්වීම.
* පිරිපුන් මානව දේහය දක්වා තිබීම.
* වස්ත්‍ර වල ස්වභාවික ලක්ෂණ ඉස්මතු කර දක්වා තිබීම.
* ළදරුවන්ගේ සහ කාන්තා රූපවල මොළකැටි සියුමැලි බව දක්වා තිබීම.
* ස්වභාවික පරිසරය සිතුවම් වල පසුබිම යොදා තිබීම.
* මානව රූප වල අඟපසඟ ප්‍රාණ ගුණයෙන් යුතුව දක්වා තිබීම.

උදාහරණ සිතුවම් : * මොනාලිසා සිතුවම
* ගිරි අරණේ මරියතුමිය සිතුවම
* අවසන් භෝජන සංග්‍රහය සිතුවම

**දෙවන වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය - චිත්‍ර කලාව II - ආදර්ශ චිත්‍රය - පිළිතුරු පත්‍රය**

**ශාලාධිපති සඳහා උපදෙස්**

පෙට්ටියක්
මැටි කලයක් කුඩා ප්‍රමාණයේ
වීදුරු ජෑම් බෝතලයක් වර්ණවත් ජලය අඩක් පිරවූ
ක්‍රෝටන් අත්තක්
කොටු හෝ ඉරි සහිත අත් පිස්නාවක්
ඩ්‍රෝවින් ලෑල්ලක්
ආදර්ශ රූපයේ සඳහන් පරිදි ගැලපෙන පරිමාණයන්ගෙන් සපයා ගන්න. ජෑම් බෝතලයේ කට ඇස් මට්ටමෙන් තබන්න.

**දෙවන වාර පරීක්ෂණය - 2019 - 12 ශ්‍රේණිය - චිත්‍ර කලාව II - ලකුණු දීමේ නිර්ණායක**

**නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

අභිමාතාර්ථ

1. ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතය පිළිබඳ කුසලතාව හා ක්‍රම ශිල්ප භාවිතය මැන බැලීම.
2. රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන් ගේ ගති ලක්ෂණ නිරූපණය වනසේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3. වර්ණ භාවිතා කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණා භාවිතාය පිළිබඳ හැකියාව මැන බැලීම

II වන පත්‍රය සඳහා අපේක්ෂකයන් ඇඳ ඇත්තේ එක් වර්ණ චිත්‍රයක් පමණි. මෙයත් ද්‍රව්‍ය සමූහය ඇසුරින් යථාරූපී චිත්‍රයක් ඇද වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු තීරණය කල යුතුවේ. එකිනෙක නිර්ණායකත් යටතේ තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීමෙ කල යුතුවේ.

ලකුණු දීමේ නිර්ණායක :-

01. ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් ව සංරචනය කිරීමේ හැකියාව (ල. 20)
02. ද්‍රව්‍යයක්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව (ල. 20)
03. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාන්තලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය)(ල.20)
04. වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම. (ල. 20)
05. චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව (ල. 20)

II වන ප්‍රශ්න පත්‍රය සඳහා හිමිවන මුළු ලකුණු 100

**දෙවන වාර පරීක්ෂණය 2019 - 12 ශ්‍රේණිය - චිත්‍ර කලාව III - ලකුණු දීමේ නිර්ණායක**

**"අ" කොටස - චිත්‍ර සංරචනය**

ලකුණු දීමේ පටිපාටිය:-

**III - පත්‍රය 'අ' චිත්‍ර සම්පිණ්ඩනය**

1. තොරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව (ලකුණු 20)
2. රේඛා හැඩතල ඇසුරින් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව (ලකුණු 20)
3. සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පරිමාණ, පර්යාලෝකය,ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය(ල.20)
4. වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව (ලකුණු 20)
5. අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව (ලකුණු 20)

(ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

**III - පත්‍රය 'ආ' මෝස්තර හා සැරසිලි නිර්මාණය**

1. මාතෘකාවට අදාල නිර්මාණ කාර්යයට උචිත අයුරින් (ලකුණු 20)
2. පාරිභාරික අවශ්‍යතාවයන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදා ගැනීමේ හැකියාව
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය (ලකුණු 20) (ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

**III - පත්‍රය 'ඉ' ග්‍රැෆික් නිර්මාණය**

1. මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවයකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව (ලකුණු 20)
2. වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව. (ලකුණු 20)
3. රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව (ලකුණු 20)
4. උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව (ලකුණු 20)
5. විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය(ලකුණු 20) (ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු 100)

**<u>දෙවන වාර පරීක්ෂණය 2019 චිත්‍ර කලාව II පත්‍රය - ආදර්ශ චිත්‍ර සටහන</u>**

**<u>இரண்டாந் தவணைப் பரீட்சை – 2019 சித்திரக்கலை – பகுதி II – மாதிரி பத்திரம்</u>**

**<u>12 ශ්‍රේණිය – தரம் 12</u>**

**<u>ශාලාධිපතිට උපදෙස්</u>**

**අවශ්‍ය ද්‍රව්‍ය :-** පෙට්ටියක්
මැටි කලයක් කුඩා ප්‍රමාණයේ
වීදුරු ජෑම් බෝතලයක් වර්ණවත් ජලය අඩක් පිරවූ
ක්‍රෝටන් අත්තක්
කොටු හෝ ඉරි සහිත අත් පිස්නාවක්
ඩ්‍රෝවින් ලෑල්ලක්
ආදර්ශ රූපයේ සඳහන් පරිදි ගැලපෙන පරිමාණයන්ගෙන් සපයා ගන්න. ජෑම් බෝතලයේ කට ඇස් මට්ටමෙන් තබන්න.

**மேற்பார்வையாளருக்குரியது.**

**தேவைப்படுபவை :**
சிறிய குடம்
காட்போர்ட் பெட்டி
கண்ணாடி ஜேம் போத்தல் (அரைவாசி வர்ண நீர் நிரப்பியது)
சிறிய எஸ்லோன் பட்டதுண்டு
குரோட்டன் கொப்பு
சிறிய சதுரம் அல்லது கோடுகொண்ட துணிதுண்டு
ஆதாரப்பலகை
மாதிரி படத்தை அவதானித்து கண்மட்டத்திற்கு பொருட்களை வைக்கவும்.

